ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ　සන්නිවේදන දෙපාර්තමේන්තුව

දිනය　2014 දෙසැම්බර් 31

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 දෙසැම්බර්**

2014 දෙසැම්බර් මාසය තුළදී, බැංකු සහ මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් මූල්‍ය අංශය ඒකාබද්ධකරණ ක්‍රියාවලියේ තවදුරටත් ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී.

- මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්සීඑස්එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් සහ එම්බීඑස්එල් සේවිංග්ස් බැන්ක් ලිමිටඩ් අතර ඒකාබද්ධවීම අවසන් අදියරට ළඟා වූ අතර, එය නුදුරු දිනකදී සිදුවීමට නියමිතය. මෙලෙස ඒකාබද්ධ වූ ආයතනය ලියාපදිංචි මූල්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වනු ඇත.

- බැංකු ත්‍රිත්වයක් එනම්, ඩීඑෆ්සීසී බැංකුව, නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී සහ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී, ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සලසන ඩීඑෆ්සීසී බැංකුවෙහි සාංගමික ව්‍යවස්ථාවලිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුමැතිය ලබාදී ඇත. ඒකාබද්ධවීම සාර්ථක අයුරින් සිදුකිරීම සඳහා මෙම බැංකු ඔවුන් විසින් පත්කරන ලද අභ්‍යන්තර කමිටු හරහා සමීපව කටයුතු කරමින් සිටී.

- මුදල් අමාත්‍යාංශය මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය යටතේ සිදුවන ඒකාබද්ධවීම් සහ අත්පත්කර ගැනීම් වලදී නිකුත් කරන කොටස් සහතික සඳහා අදාළ මුද්දර ගාස්තු නිදහස් කිරීම සම්බන්ධ ගැසට් නිවේදනය නිකුත් කර ඇත.

- ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ස්ථාවර සහ ලාභදායී මට්ටමකට ගෙන ඒමෙහි අරමුණෙන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල උපයෝගී කර ගනිමින්, එම සමාගම වෙත දිගුකාලීන ණය මුදලක් සහනදායී කොන්දේසි යටතේ ප්‍රදානය කරන ලදී.